# ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව
# காணி ஆணையாளர் நாயகத்தின் திணைக்களம்
# LAND COMMISSIONER GENERAL'S DEPARTMENT

"මිහිකත මැඳුර", ඉඩම් මහලේකම් කාර්යාලය, 1200/6, රජමල්වත්ත පාර, බත්තරමුල්ල.
"மிஹிகத்த மெதுர", காணிச் செயலகம் 1200/6, இராஜமல்வத்த வீதி, பத்தரமுல்ல.
"Mihikatha Medura", Land Secretriat,1200/6, Rajamalwatta Road, Battaramulla.

☎ 011 279 7400
🖷 011 286 4051


මගේ අංකය / எனது இல / My No. } L2/1/65/චක්‍රලේඛ/2021

ඔබේ අංකය / உமது இல / Your No }

දිනය / திகதி / Date } 2021.11.03

**චක්‍රලේඛ 2021/07**

සියළුම ප්‍රාදේශීය ලේකම්වරු,

**<u>ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ බැහැර කරනු ලබන ඉඩම්වල අවම බෙදුම් සීමාව සංශෝධනය කිරීම</u>**

2021 ඉඩම් සංවර්ධන රෙගුලාසි, අංක 2251/48 හා 2021.10.28 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ පලකර ඇති අතර එමගින් ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ බැහැර කරනු ලබන ඉඩම්වල අවම අනුබෙදුම් ඒකකය පහත පරිදි සංශෝධනය කර ඇත.

i. ගොඩ ඉඩම් - එම ඉඩම් පිහිටි පළාත් පාලන බල ප්‍රදේශයේ අවම අනුබෙදුම් ඒකකය
ii. වාරිමාර්ග පහසුකම් සහිත ඉඩම් - අක්කර1 යි
iii. වාණිජ භෝග සඳහා බැහැර කර ඇති ඉඩම් - අක්කර 1යි
iv. මධ්‍යම පන්තික ඉඩම් - අක්කර 2 ½ යි
v. අහස් දියෙන් වගා කරනු ලබන ගොඩ ඉඩම් - අක්කර 1 යි

02. ඒ අනුව ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ බැහැර කරනු ලබන ඉඩම්වලට අදාලව අවම බෙදුම් සීමාවන් ඉහත පරිදි සංශෝධනය වන අතර අවසර පත්‍ර හා දීමනා පත්‍ර මගින් දැනටමත් බැහැර කර ඇති ඉඩම්වල අවම අනු බෙදුම් ඒකකය සංශෝධනය කළ යුතු ආකාරය පැහැදිලි කරදීම සඳහා මෙම චක්‍රලේඛය නිකුත් කරනු ලැබේ.

03. දැනටමත් බැහැර කර ඇති ඉඩම්වලට අදාල අවසරපත්‍ර හා දීමනාපත්‍රවල අවම අනු බෙදුම් ඒකකය සංශෝධනය කර දෙන ලෙස අවසරපත්‍ර ලාභීන්/ දීමනාපත්‍ර ලාභීන් ඉල්ලුම් කරනු ලබන අවස්ථාවලදී ඉහත රෙගුලාසිය අනුව "අ" ආකෘතිය යොදාගනිමින් පිටසන් කිරීමට ක්‍රියාකල යුතු වේ.

04. දීමනාපත්‍රයේ හා එහි පිටපත්වල අවසන් පිටුවේ "අ" ආකෘතිය යතුරු ලියනය කර හෝ මුද්‍රණය කර දීමනාපත්‍රකරුගේ හා ඔබගේ අත්සන් යොදා (නිල මුද්‍රාව තැබීම අනිවාර්යය වේ) අවම අනු බෙදුම් ඒකකය හා අවම භාගය සංශෝධනය කිරීමට ක්‍රියාකල යුතු වේ.

.05. අවසරපත්‍රයක අනු බෙදුම් ඒකකය සංශෝධනය කරගන්නේ නම් පිටසන වෙනම මුද්‍රණය කර නියමිත පරිදි අත්සන් යොදා අවසර පත්‍රයේ මුල් පිටපතට හා අනු පිටපතට අමුණා තැබීමට ක්‍රියාකල යුතු වේ.

06. දීමනාපත්‍රයක් මගින් ලබාදී ඇති ඉඩමක් හෝ ඉන් කොටසක් ප්‍රාදේශීය ලේකම්ගේ අවසරය ඇතිව නීත්‍යානුකූලව බැහැර කර ඇති අවස්ථාවක එසේ බැහැර කරන ලද එම ඉඩම හෝ ඉඩම් කොටසට අදාල නොතාරිස් ඔප්පුවේ අවම බෙදුම් සීමාව සංශෝධනය කිරීමට ඉල්ලීමක් ඉදිරිපත් වන අවස්ථාවකදී පිටසන් කිරීම සඳහා "ආ" ආකෘතිය යොදා ගත යුතු අතර එහි නියමිත පරිදි අත්සන් යොදා නොතාරිස් ඔප්පුවේ මුල් පිටපතට හා අනු පිටපත්වලට ඇමිණීමට ක්‍රියා කල යුතු වේ.

07. සංශෝධනය කරනු ලබන දීමනාපත්‍ර හා නොතාරිස් ඔප්පුවල එම සංශෝධනයන් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කිරීමට කටයුතු කලයුතු අතර එසේ ලියාපදිංචි කරන ලද ලේඛණයේ පිටපතක් අදාල ගොනුවේ ගොනුකර තැබිය යුතු වේ.

08. එමෙන්ම "අතුරු බෙදීම්වලට අවසර නැත" ලෙස සඳහන් කර ඉ.කො. 143 ආකෘතිය මගින් නිකුත් කර ඇති දීමනාපත්‍රවල අවම අනු බෙදුම් ඒකකය සංශෝධනය කිරීම සඳහා ඉදිරිපත් වන අවස්ථාවලදී ද නියමිත පිටසන යොදා ලියාපදිංචි කිරීමට ක්‍රියාකල යුතු වේ.

09. බැහැර කර ඇති වාරි ඉඩමක අවම බෙදුම් සීමාව සංශෝධනය කිරීමට පෙර එම වාරි ඉඩමෙන් බෙදා වෙන් කරනු ලබන සෑම ඉඩම් කොටසකටම ස්වාධීන ජල සැපයුමක් හා ප්‍රවේශ පහසුකම් ලබාදීම සම්බන්ධයෙන් සැලකිලිමත් විය යුතු අතර ඒ සම්බන්ධයෙන් වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ එකඟතාවය ලබා ගැනීමට ක්‍රියාකල යුතු වේ.

10. ඉහත උපදෙස් අනුව ක්‍රියා කිරීමේදී යම් ගැටළුවක් මතුවන්නේ නම් ඒ සම්බන්ධයෙන් ම වෙතින් උපදෙස් ලබා ගැනීමට ක්‍රියාකරන ලෙස කාරුණිකව දන්වමි.

ජී.ඩී. කීර්ති ගමගේ
ඉඩම් කොමසාරිස් ජනරාල්

පිටපත් :

1. ජනාධිපති ලේකම්, ජනාධිපති ලේකම් කාර්යාලය
2. ලේකම්, ඉඩම් අමාත්‍යාංශය
3. සර්වේයර් ජනරාල්, මිනින්දෝරු දෙපාර්තමේන්තුව

} කරු. දැ.ගැ.ස.

4. රෙජිස්ට්‍රාර් ජනරාල්, රෙජිස්ට්‍රාර් ජනරල් දෙපාර්තමේන්තුව
5. අධ්‍යක්ෂ ජනරාල්, වාරිමාර්ග දෙපාර්තමේන්තුව
6. අධ්‍යක්ෂ ජනරාල්, ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය
7. සියළුම පළාත් ඉඩම් කොමසාරිස්වරුන් / ඉඩම් කොමසාරිස්වරුන් (අන්තර් පළාත්)
8. සියළුම සහකාර ඉඩම් කොමසාරිස්වරුන් (අන්තර් පළාත්)

} කරු. දැ.ගැ.ස. හා අ.ක.ස.